# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,874 — 1969 ඔක්තෝබර් 2 වැනි බ්‍රහස්පතින්ද — 1969.10.2

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පණත් ... ... ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් ... ... | 128 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | 127 | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | 128 | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |
| පිස්කෑල් මාර්ෂල්වරුන් පත් කිරීම ... ... | — | | |


## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි ආඥාපනතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරී බලයෙන්, අග්‍ර විනිශ්චයකාර ධුරන්ධර හියු නෝමන් ග්‍රේෂරි ප්‍රනාන්දු වන මම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර මණ්ඩලයේ අදහස් විමසා එයට සෑහෙන කරුණු පෙනී ශ්‍රේෂ්ඨාධිකරණයේ බටහිර චාරිකාව සඳහා 1969 ඔක්තෝබර් මස 11 වැනි සෙනසුරාදා සිට කොළඹදී අතිරේක අපරාධ අධිකරණ වාරයක් පැවැත්වීමට නියෝග කරමි.

එච්. ඇන්. ජී. ප්‍රනාන්දු,
අග්‍ර විනිශ්චයකාර.

1969 සැප්තැම්බර් මස 22 වැනි දින,
මහනුවර දීය.

10-156

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි ආඥාපනතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරී බලයෙන්, අග්‍ර විනිශ්චයකාර ධුරන්ධර හියු නෝමන් ග්‍රේෂරි ප්‍රනාන්දු වන මම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර මණ්ඩලයේ අදහස් විමසා එයට සෑහෙන කරුණු පෙනී ශ්‍රේෂ්ඨාධිකරණයේ බටහිර චාරිකාව සඳහා 1969 ඔක්තෝබර් මස 11 වැනි සෙනසුරාදා සිට මීගමුවේදී අතිරේක අපරාධ අධිකරණ වාරයක් පැවැත්වීමට නියෝග කරමි.

එච්. ඇන්. ජී. ප්‍රනාන්දු,
අග්‍ර විනිශ්චයකාර.

1969 සැප්තැම්බර් මස 22 වැනි දින,
මහනුවර දීය.

10-153

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි ආඥාපනතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරී බලයෙන්, අග්‍ර විනිශ්චයකාර ධුරන්ධර හියු නෝමන් ග්‍රෙගරි ප්‍රනාන්දු වන මම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර මණ්ඩලයේ අදහස් විමසා එයට සෑහෙන කරුණු පෙනී ශ්‍රේෂ්ඨාධිකරණයේ බටහිර චාරිකාව සඳහා 1969 ඔක්තෝබර් මස 11 වැනි සෙනසුරාදා සිට කළුතරදී අතිරේක අපරාධ අධිකරණ වාරයක් පැවැත්වීමට නියෝග කරමි.

එච්. ඇන්. ජී. ප්‍රනාන්දු,
අග්‍ර විනිශ්චයකාර.

1969 සැප්තැම්බර් මස 22 වැනි දින,
මහනුවර දීය.

10-154

---

## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි ආඥාපනතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරී බලයෙන්, අග්‍ර විනිශ්චයකාර ධුරන්ධර හියු නෝමන් ග්‍රෙගරි ප්‍රනාන්දු වන මම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර මණ්ඩලයේ අදහස් විමසා එයට සෑහෙන කරුණු පෙනී ශ්‍රේෂ්ඨාධිකරණයේ බටහිර චාරිකාව සඳහා 1969 ඔක්තෝබර් මස 11 වැනි සෙනසුරාදා සිට රත්නපුරයේදී අතිරේක අපරාධ අධිකරණ වාරයක් පැවැත්වීමට නියෝග කරමි.

එච්. ඇන්. ජී. ප්‍රනාන්දු,
අග්‍ර විනිශ්චයකාර.

1969 සැප්තැම්බර් මස 22 වැනි දින,
මහනුවර දීය.

10-155

---

# දිසත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම්

ක්‍රි. ව. 1948 සිට 1964 දක්වා කාලය තුළ මීගමුව මහේස්ත්‍රාත් උසාවියේ පවරා ඇති නඩුවල නඩු පොත් විනාශ කිරීම නොබෝ දිනකින් ආරම්භ කරනු ලැබේ. මෙම නඩු සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන යමෙකු සිටිතොත් ඔහු විසින් යම්කිසි නඩු පොතක් තව දුරටත් විනාශ නොකර තබාගැනීමට කැමැත්තෙහිනම් 1969.9.30 වැනි දින හෝ එයට පෙර ඒ බව ලිපියක් මගින් මීගමුව මහේස්ත්‍රාත් තැනට දැන්විය යුතුය.

ඩග්ලස් විජයරත්න,
මීගමුව මහේස්ත්‍රාත්.

1969.9.22 වැනි දින,
මීගමුව, මහේස්ත්‍රාත් උසාවියේ දීය.

10-61

# පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## බස්නාහිර පළාත

### කළුතර රික්වෙස්ට් නඩු ශාලාවේදීය

පයියාගල, පොතුවිල පදිංචි කෝට්ටගොඩගේ ලූවිස් සිංඤෝ අප්පුහාමි ........................................ පැමිණිලිකාරයා.

නොම්මරය 5833 එදිරිව

පයියාගල, පොතුවිල පදිංචි වික්‍රමාරච්චිගේ දොන් සොමිපාල ................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1969ක් වූ නොවැම්බර් මස 17 දින පෙරවරු 10ට පළමු ඉඩමද, පෙරවරු 10.45ට දෙවෙනි ඉඩම ද ඒ ඒ ස්ථානවලදීම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දැන්වනු ලැබේ.

1. මෙම ඉඩම් විකුණනු ලබන්නේ ප්‍රසිද්ධ නොතාරිස් තැන වන ඊ. ඇප්. කුරේ විසින් සහතික කරනලද අංක 316 සහ 1959.8.12 දිනැති උගස් ඔප්පුව ප්‍රකාර මුල් මුදල, පොලිය සහ ගාස්තුව වන රුපියල් හාරසියයක් සහ එම මුදලට සියයට දොළහ බැගින් 1959 අගෝස්තු මස 12 වැනි දින සිට 1968 නොවැම්බර් මස 13 වැනි දින දක්වා පොලිය ද, 1968 නොවැම්බර් මස 13 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවනතෙක් ඊට නීත්‍යානුකූල පොලිය ද, උසාවියේ ලේකම් විසින් තක්සේරු කරන අන්දමට මෙම නඩුවේ ගාස්තු ද, පවුන්ඩේජ් ගාස්තු සහ පිස්කල් ගාස්තු ද අයකරගැනීම සඳහා ය.

#### උපලේඛනය

1. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණේ පයියාගල් බද්දේ ගබඩාගොඩ පිහිටි ඇටඹගහවත්ත නමැති ඉඩමේ පිහිටි විත්තිකරු විසින් සෑදූ හුණු කපරාරුකර උළු සෙවිලිකළ ගෙය ඇතුළුව ඉඩමෙන් සහ ගහකොළින් ද නොබෙදූ නමෙන් එකෙන් හයෙන් එකෙන් පහෙන් එකක් (1/9න් 1/6න් 1/5) සහ එකසිය තිස්පහෙන් දෙකෙන් අටෙන් එකක් සහ එකසිය හැටදෙකෙන් හතෙන් අටෙන් එකක් (2/135න් 1/8ක් සහ 7/162න් 1/8). ඊට මායිම්: උතුරට: මහවත්තගේ අයගේ නමින් ඇති ඉඩම, නැගෙනහිරට: රජය සතු ඉඩම, දකුණට: බෝම්බුවලගේ දොන් බැස්තියන් අප්පු වාසය කරන ඉඩම සහ බටහිරට ගබඩගේට අයිති ඉඩම. ප්‍රමාණය අක්කර දහතුනයි (අ. 13, රූ. 0, ප. 0.)

2. ඉහත කී ගබඩගොඩ පිහිටි ඇටඹගහවත්තේ ඕවිට නමැති ඉඩම සහ එහි ඇති සියළුම දෙයින් නොබෙදූ එකසියතිස්පහෙන් දෙකෙන් අටෙන් එකක් සහ අසූඑකෙන් දහ හතරෙන් අටෙන් එකක් සහ අනූවෙන් හතෙන් දහසයෙන් එකක් (2/135න් 1/8 සහ 14/81න් සහ 1/8 සහ 7/90න් 1/16). ඊට මායිම්: උතුරට: ගබඩාගේ නමින් ඇති ඉඩම, නැගෙනහිරට: අබේහාමිගේ ඉඩම, දකුණට: ඇටඹගහවත්ත සහ බස්නාහිරට: වැලිලියද්ද වේ. ඉඩම් ප්‍රමාණය වී කුරුණී අටක් පමණ වපුසරිය ඇති නමුත් අක්කර දෙකක් පමණ. (අ. 2, රූ. 0, ප. 0.)

ස. ද. සි. විතාරණ,
අතිරේක නියෝජ්‍ය පිස්කල්, කළුතර.

වර්ෂ 1969ක් වූ සැප්තැම්බර් මස 20 දින,
කළුතර නියෝජ්‍ය පිස්කල් කන්තෝරුවේ දීය.

10-75

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ.**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ.)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දින වලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමඟම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත '' පිටපත '' කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන් කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | 20 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | | ... | ... | 20 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | | ... | ... | 220 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | | ... | ... | 440 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ '' ගැසට් '' පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිතැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | | | මෙරට | | පිටරට |
|---|---|---|---|---|---|
| | | | රු. ශ. | | රු. ශ. |
| එක් කොටසක් ... | ... | ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ජෙදයක් | ... | ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ජෙද දෙකක් | ... | ... | 43 50 | ... | 51 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | | | මිළ | | තැපැල් ගාස්තු මෙරට |
|---|---|---|---|---|---|
| | | | රු. ශ. | | රු. ශ. |
| (අ) i ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලතදී එක කොටසක් | — | — ... | 0 50 | ... | 0 20 |
| ii ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් | ... | ... ... | 1 0 | | 0 20 |
| (ආ) i ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ජෙදයක් | ... | ... | 0 30 | ... | 0 15 |
| ii ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ජෙදයක් | ... | ... | 0 60 | ... | 0 15 |

දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1969**

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | ... | 69. 9. 5 සිකුරාද | ... | 69. 8.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.12 සිකුරාද | ... | 69. 9. 5 සිකුරාද | ප.ව. | 3 30 |
| | | 69. 9.19 සිකුරාද | ... | 69. 9.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.26 සිකුරාද | ... | 69. 9.19 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | ... | 69. 9.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.10. 9 බ්‍රහස්පතින්ද | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.17 සිකුරාද | ... | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.24 සිකුරාද | ... | 69.10.17 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.10.31 සිකුරාද | ... | 69.10.24 සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් | ... | 69.11. 7 සිකුරාද | ... | 69.10.31 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.11.14 සිකුරාද | ... | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.11.21 සිකුරාද | ... | 69.11.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.11.28 සිකුරාද | ... | 69.11.21 සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් | .. | 69.12. 5 සිකුරාද | ... | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.12 සිකුරාද | ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 69.12.19 සිකුරාද | ... | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.26 සිකුරාද | ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි